සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය

நலன்புரி நன்மைகள் சபை

**WELFARE BENEFITS BOARD**

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| මගේ අංකය / எனது இல / My No. | WBB/Notice/D/Div/2024 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2024.02. 26 |
|---|---|---|---|---|---|

WBB/Circular/No-05/2024

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ නියෝජ්‍ය සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත,

**<u>අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය පළමු වටයේ සුදුසුකම්ලාභී පවුල් තෝරාගැනීමේ ක්‍රියාවලිය තුල වැඩ අවසන් නොවූ අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම.</u>**

අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමය යටතේ පළමු අදියරේදී ඉදිරිපත් වූ අයදුම්කරුවන් අතුරින් විවිධ හේතූන් මත නියමිත කාලපරිච්ඡේදය තුලදී තේරීම් ක්‍රියාවලියේ වැඩ පියවර අවසන් කිරීමට නොහැකි වූ අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය පිළිබඳව උපදෙස් නිකුත් කිරීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ.

දැනට අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් යෝජනා ක්‍රමයේ දෙවන අදියර සඳහා අයදුම්පත් කැඳවීම ආරම්භ කර ඇති අතර ඒ සඳහා IWMS පරිගණක පද්ධතිය සූදානම් කර ඇති හෙයින් පළමු අදියරේ ඉහත සඳහන් කළ ආකාරයේ වැඩ අවසන් නොවූ අයදුම්පත් සම්බන්ධයෙන් මුලින් අනුගමනය කරන ලද වැඩ පියවර ඒ ලෙසම එම පද්ධතිය තුල අනුගමනය කිරීමට හැකියාවක් නොමැත. මෙම තාක්ෂණික ගැටළුව හේතුවෙන් එම වැඩ අවසන් නොවූ අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ආකාරයට විකල්ප ක්‍රමවේද අනුගමනය කිරීමට පියවර ගත යුතුයි.

01. විවිධ හේතූන් මත සංගණනයට භාජනය කිරීමට නොහැකි වූ අයදුම්පත් :-
    මෙවැනි අයදුම්කරුවන් වෙත QR කේත නිකුත්ව නැති හෙයින් දෙවැනි අදියරේදී අයදුම් කිරීමට අවස්ථාව ඇත. ඒ සඳහා ඔවුන් උනන්දු කරවිය යුතුය.

02. සුදුස්සන් තේරීමේ ක්‍රියාවලියේදී තේරීම් කමිටු මගින් අනුමත කර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබාදීම සඳහා ලබා දී තිබූ අවසාන දිනට එසේ සිදුකර නොතිබූ අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

02.01 පළමු අදියර සඳහා පරිගණක පද්ධතිය මගින් තේරීම් කමිටු මගින් අනුමත කිරීමේ ක්‍රියාවලිය දෙවැනි අදියර ආරම්භ කිරිමත් සමග දැන් අත්හිටුවා ඇත. එබැවින්, තේරීම් කමිටුව විසින් අනුමත කර නොමැති මෙවැනි අයදුම්පත් සම්බන්ධයෙන් පහත සඳහන් විකල්ප ක්‍රමවේද යටතේ තෝරාගැනීමේ ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ.


කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151487
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk


Scanned with CamScanner

1 වැනි පියවර - සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයෙන් අදාල අයදුම්කරුවන්ගේ ලේඛන IWMS පද්ධතිය තුළින් තෝරාගෙන ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කරනු ලැබේ.

2 වැනි පියවර - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තේරීම් කමිටුව විසින් තොරතුරු ලබාගෙන අවශ්‍ය පරීක්ෂණ සිදු කර භෞතිකව එනම් පරිගණක පද්ධතියෙන් පරිබාහිරව තීරණ ලබාදීම හා එම තීරණ සුබසාධක මණ්ඩලය වෙත යොමු කිරීම.

3 වැනි පියවර - සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් පරිගණක පද්ධතිය තුළින් අභියාචනා ඇතුලත් කර ඒවා සම්බන්ධයෙන් තීරණ ලබා දීම සඳහා අභියාචනා කමිටු වලට යොමු කිරීම.

4 වැනි පියවර - අභියාචනා කමිටු විසින් පරිගණක පද්ධතිය තුළින් තේරීම් කමිටුවේ තීරණ මත පදනම්ව තීරණ ලබාදීම හා එම තීරණ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත යොමු කිරීම.

5 වැනි පියවර - අභියාචනා කමිටුවේ තීරණ පරීක්ෂා කර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අනුමත කිරීම.

02.02 තේරීම් කමිටුව විසින් නැවත සංගණනය සඳහා වෙන් කර තබා ඇතත් ඉන් පසුව ඉදිරි කටයුතු සිදු නොකළ අයදුම්පත් සම්බන්ධයෙන්ද ඉහත වැඩ පියවර අනුගමනය කළ හැක. එහිදී නිලධාරීන් යොදවා නැවත සංගණනය සිදු කිරීමෙන් පසුව තේරීම් කමිටුවේ අනුමැතිය ලබා දිය හැකියි.

03. නියමිත දිනට පසුව තේරීම් කමිටුව විසින් අනුමත කරන ලද අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම :-
මෙවැනි අයදුම්පත් වලට අදාලව සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් පරිගණක පද්ධතිය තුළින් අභියාචනා ඇතුලත් කර ඒවා අභියාචනා කමිටුවලට යොමු කරනු ලැබේ. අභියාචනා කමිටු මගින් ඒවා සම්බන්ධයෙන් තීරණ ලබා දීමෙන් පසුව එම තීරණ පදනම් කරගෙන තෝරාගැනීම් සිදු කරනු ලැබේ. මෙහිදී අභියාචනා කමිටුව හා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් තේරීම් කමිටුවේ තීරණ මත පදනම්ව අනුමත කිරීම් සිදුවේ.

ඉහත උපදෙස් පරිදි පළමු අදියරේ වැඩ අවසන් නොවූ අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස කාරුණිකව දන්වමි.

ජයන්ත විජේරත්න
සභාපති/කොමසාරිස්

පිටපත් : සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/අතිරේක සුබසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් : අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සඳහා

Scanned with CamScanner